
# රණවරුණ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි**

52 වන කලාපය
2025 ජනවාරි - මාර්තු

# RANAWARUNA

## 144 වන විශේෂ සංවත්සර කලාපය



ධීර වීර එඩි ගති පෑ හෙළයන්
මව්බිමෙ රන් වැට මෙන් රැකි සුරුවන්
රට දැය ප්‍රාණය සම කළ සොයුරන්
සදා පුදමු සෙව් බළ සෙන් විරුවන්

2025 අප්‍රේල් මස 01 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවට වසර 144 ක් සැපිරීම වෙනුවෙන් පැවැත්වූ සම්මාන මුරය.



**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ යුඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කරනු ලබන සුභාශිංසන පණිවුඩය.**

"සිලෝන් වොලන්ටියර්ස්" නමින් ඇරඹී, ශ්‍රී ලංකාවේ ප්‍රථම හමුදාව ලෙස සියවසක් ඉක්මවමින් තවත් අඩසියවසකට ආසන්න දීර්ඝවූත්, ප්‍රෞඪවූත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සර දිනය අප්‍රේල් මස පළමු වන දිනට යෙදී ඇති අතර, ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස මෙසේ සංවත්සර දින පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම, මා ලද භාග්‍යයක් ලෙස සලකන අතර, ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජිකයන් වෙත සුභාශිංසන පිරිනමන්නේ හදපිරි සතුටිනි.

තිස් වසරක යුද ඉතිහාසය තුළ ස්වේච්ඡා සාමාජිකයන් මාතෘ භූමියෙහි භෞමික අඛණ්ඩතාව, ස්වෛරීභාවය හා ඒකීයභාවය වෙනුවෙන් ඉදිරිපත්වූ අතර ත්‍රස්තවාදය අවසන් කිරීමේ තීරණාත්මක මෙහෙයුම්වලදී අභීත සොල්දාදුවන් පිරිසක් ලෙස කළ කැපකිරීම් මේ මොහොතේ අභිමානයෙන් සිහිපත් කරමි. ඒකක 65 කින් හා පුහුණු පාසලකින් සමන්විතව ස්වේච්ඡා සාමාජිකයන් 48000 කට ආසන්න පිරිසකගෙන් සැදුම්ලත් ස්වේච්ඡා බළසේනාව යුද හමුදාවේත් රටෙහිත් අභිවෘද්ධිය පිණිස විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තම රාජකාරිය ඉටුකරමින් සිටිති.

එදා, අද මෙන්ම හෙටත් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට මෙන්ම ශ්‍රී ලාංකේය ජනජීවිතයට තර්ජනයක් වන අවස්ථාවලදී ජාතියේ ආරක්ෂකයා ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයන් ලෙස ස්වේච්ඡාවෙන්ම කටයුතු කරන සියලුම සාමාජිකයන්ට තම මාතෘ භූමිය වෙනුවෙන් ඉටු කිරීමට භාරදූර වගකීම් රාශියක් ඇත. එය කුමන ක්ෂේත්‍රයක කවර අභියෝගයක් වුවත් තම රාජකාරිය නිසි ලෙස ඉටුකිරීමට ඔබ සියලු දෙනා පුද්ගලිකව මෙන්ම පොදුවේද ඇපකැපවිය යුතුය. ඉදිරි වර්ෂ කිහිපය තුළදී වඩාත් ක්‍රමවත්ව හා ඵලදායි ලෙස රටේ සංවර්ධනය සඳහා වන ඉලක්ක වෙනුවෙන් දායකත්වය ලබාදීමට ක්‍රියාකිරීම පුරවැසියන් මෙන්ම රාජ්‍ය සේවකයන් ලෙස ඔබ සියලු දෙනා වෙත ඇති භාරදූර වගකීමකි.

වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන මගින් අප අවට පරිසරය හා කාර්යාලයීය පරිසරය පවිත්‍රව තබාගැනීම මෙන්ම සියලු දෙනාගේ අභ්‍යන්තර ආකල්පවල ධනාත්මක වෙනසක් සිදුකිරීමද අපේක්ෂා කරයි. එනම් තම රාජකාරිය ක්‍රමවත්ව සහ ඵලදායීව ඉටුකිරීමටත් දූෂණය, අල්ලස පිටුදකිමින් විනයගරුක පුරවැසියන් ලෙස කටයුතු කිරීමටත් හැකි වටපිටාව නිර්මාණය කර ගැනීම සඳහා එම වැඩසටහන මඟපෙන්වයි. ගෞරවනීය හමුදාවක රාජකාරි කරන, ඔබ තමාටත් තම ආයතනයටත් රටටත් ආදර්ශමත් පුද්ගලයෙකු ලෙස නිර්මාණය වීම, අත්‍යවශ්‍ය කරුණකි. විශේෂයෙන්ම රණකාමීත්වය ප්‍රදර්ශනය කළ දක්ෂ හමුදාවක සාමාජිකයන් ලෙස අනාගතයේදී එල්ල විය හැකි කවර ආකාරයක අභියෝගයකට වුවද මුහුණදීමට අවශ්‍ය දැනුමින් හා අත්දැකීම්වලින් ඔබ සන්නද්ධ විය යුතුයි. එම ඉලක්ක වෙත ගමන් කිරීම සඳහා වන අභියෝග තේරුම් ගෙන අනාගතයට ගැළපෙන පරිදි පුහුණු

සැලැසුම් සහිතව ඉදිරියට යා යුතුයි. යුද්ධ හමුදාව විසින් ගොඩනගාගත් කීර්තිනාමය තව තවත් වර්ධනය වන ලෙස විනයගරුකව කටයුතු කිරීමට ඔබ සියලු දෙනා වගබලාගත යුතුයි.

එසේම අප සැම යුද්ධ හමුදා සොල්දාදුවන් ලෙස වඩාත් සතුටින් හා තෘප්තිමත්ව ජීවත්වීම ඉතා වැදගත් කරුණකි. එසේ වූ විට පුද්ගලික මෙන්ම වෘත්තීය ජීවිතය තුළ වඩාත් නිර්මාණශීලි මෙන්ම තෘප්තිමත් පුද්ගලයන් පිරිසක් බිහිවන අතර වඩාත් යහපත් රාජකාරි වටපිටාවක් තුළින් ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු වැඩ පරිසරයක් බිහි කළ හැකිය. එසේ කටයුතු කිරීමට ඔබ අධිෂ්ඨාන කරගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට සෑම දෙනෙකුගේම මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

යුද හමුදා සාමාජිකයන් ලෙස ඔබ සියලු දෙනා විසින් ඔබගේ කායික හා මානසික යහපැවැත්ම ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාම කළ යුතු වේ. ඕනෑම අවස්ථාවකට උචිත ලෙස ක්‍රියාකිරීමටත් සුදුසු ලෙස නායකත්වය ගෙන කටයුතු කිරීමටත් ඔබට හැකි වනුයේ ඔබ සතු දැනුම, පළපුරුද්ද සහ දරාගැනීමේ ශක්තිය වර්ධනය වන පරිදි පුහුණුව සහ සාමූහික ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කිරීමෙන් බව ඔබ සැම අවබෝධ කරගත යුතුයි. මෙම සුවිශේෂී සංවත්සර සැමරුම් දිනයේදී මා ඔබට අවධාරණය කරන්නේ යුද්ධ හමුදා සොල්දාදුවෙකු වශයෙන් මනා විනයක් සහිතව අප සතු සාර්ධර්ම තවදුරටත් ආරක්ෂා වන පරිදි රාජකාරි කිරීමේ වැදගත්කම පිළිබඳවයි.

තවද ස්වේච්ඡා බළසේනාවේ උන්නතිය උදෙසා විශාල මෙහෙවරක් කළ හිටපු සේනාවිධායකවරුන් මෙන්ම නියෝජ්‍ය සේනාවිධායකවරුන් ඇතුළු සියලුම සාමාජිකයන් 144 වන සංවත්සර දිනයේදී සිහිපත් කරන අතර ස්වේච්ඡා බළසේනාවේ උන්නතිය උදෙසා නිරන්තරයෙන් කටයුතු කරන 57 වන ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස කටයුතු කළ වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ RSP ctf-ndu psc IG ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ද වර්තමාන සේනාවිධායක ලෙස මෙහිදී ඉතාමත් ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමි.

විශේෂයෙන්ම මව්බිමේ නිදහස වෙනුවෙන් තම අවසන් සුසුම් පොද මාතෘ භූමිය වෙනුවෙන් පූජා කර අභීත ලෙස මිහිතලය සිපගත් යුද විරුවන් හා රණකෂිතයට පත් සොල්දාදුවන් මෙම අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරමි. ඔවුන් එදා තම ජීවිතය පූජා කළේ, රටේ අනාගත පරම්පරාවේ හෙට දවස වෙනුවෙනි. එම අභීත විරුවන් සියලු දෙනා ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරන්නටත් ක්‍රියාන්විතවලදී රණකෂිතයට පත්වූ සියලු රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්නටත් දැනට විශ්‍රාමිකව සිටින සහ වර්තමානයේදී රාජකාරි කරන සියලු දෙනාටත් සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ඇතුළු පවුල්වල සැමටත් නිදුක් නීරෝගී චිරජීවනය සහිත වාසනාවන්ත අනාගතයක් උදාවේවායි ප්‍රාර්ථනා කරන්නටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.

කාලයට සහ අවස්ථාවට අනුකූල ලෙස තම වෘත්තීය රාජකාරිය මනාව ඉටුකරන ශක්තිමත් පෞරුෂයකින් හෙබි දක්ෂ සොල්දාදුවන් පිරිසක් ලෙස විනයගරුකව මෙන්ම ජවසම්පන්නව උපන් දේශයට ගෞරවයක් අත්කර දෙමින් හෙට දවසේදීත් තම රාජකාරිය මනාව ඉටුකරන්නට ස්වේච්ඡා සාමාජිකයන් සියලු දෙනාට නිබඳ ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවායි 144 වන  සංවත්සර දිනයේදී මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

ඩී කේ එස් කේ දොලගේ යුඑස්පී එන්ඩීඑස් පීඑස්සී
මේජර් ජෙනරාල්
සේනාවිධායක ශ්‍රීලංයුහසේවිබ

2025 අප්‍රේල් මස 01 දින



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ වසර 144 ක අභිමානය


වසර 144 ක අභිමානවත් සංවත්සරය සමරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ ඉතිහාසය පිළිබඳව තතු විමසීමේදී එය 1860 දශකය දක්වා දිව යන්නකි. කන්ද උඩරට ගිවිසුම මගින් ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතු වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ විවිධ බළඇණි වරින් වර ලංකාවේ ආරක්ෂක කටයුතුවල නිරත වී ඇත. මෙම කාලසීමාවේදී එනම් 1861 අප්‍රේල් 11 වන දින මාතලේ සහකාර ඒජන්ත කාර්යාලයේදී එවකට සහකාර ඒජන්ත බෝඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් ස්වේච්ඡා රයිෆල් රෙජිමේන්තුවක් පිහිටුවා ගැනීම සඳහා සාකච්ඡා කර අවශ්‍ය අණපනත් කෙටුම්පත් සකසා එය බ්‍රිතාන්‍ය මහරැජින වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ස්වේච්ඡා හමුදාවක් නගා සිටුවීම සඳහා වූ නියෝගය 1862 ජුලි මස 5 වන දින අංක 3326 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. කෙසේ නමුත් එම ගැසට් පත්‍රයේ සඳහන් විවිධ කොන්දේසි හේතුවෙන් සහ වෙනත් හේතූන් මත 1862 වසරේදී රයිෆල් බළකාය නමින් ස්වේච්ඡා ඒකකයක් ස්ථාපනය කිරීමට නොහැකි විය.

කෙසේ නමුදු ඊට වසර 19 කට පසු, එනම් 1881 අප්‍රේල් 01 දින ලාංකිකයින් හා සුදු ජාතිකයින්ගේ එකතුවෙන් ස්වේච්ඡා හමුදාවක් **'Ceylon Volunteers'** නමින් ස්ථාපනය කරන ලද අතර එය ලංකාව තුළ ස්ථාපිත වූ ප්‍රථම පාබල බළඇණිය විය. "ලුතිනන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ්" එහි අණදෙන නිලධාරී



ලුතිනන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ්
ප්‍රථම පාබල බළඇණියේ අණදෙන නිලධාරී

වශයෙන් පත් කරන ලද අතර, එම බළඇණිය පාලනය වූයේ ලංකා ආණ්ඩුකාරවරයා යටතේය. ආරම්භයේදී පාබල බළඇණියක් වූ මෙය පසුව අශ්වාරෝහක කණ්ඩායමක්, කාලතුවක්කු කණ්ඩායමක්, ගිලන් මැසි



කණ්ඩායමක්, ඉංජිනේරු කණ්ඩායමක් හා තූර්ය වාදක කණ්ඩායමකින්ද, පසුව ශිෂ්‍යභට කණ්ඩායමකින්ද සමන්විත විය. 1881 ආරම්භ වූ ස්වේච්ඡා බළකාය ක්‍රමයෙන් වර්ධනය වී 1910 වර්ෂය වන විට බළඇණි කිහිපයක් දක්වා වර්ධනය විය. 1888 අප්‍රේල් 20 වන දින බඳවා ගන්නා ලද ස්වේච්ඡා සාමාජිකයින් 27 දෙනෙකුගෙන් යුත් ඛණ්ඩය ලංකා ස්වේච්ඡා කාලතුවක්කු හමුදාව නගාසිටුවීමට බඳවාගෙන ඇත. පසුව එම ඒකකය ලංකා ආරක්ෂක සේනා කාලතුවක්කු හමුදාව විය. 1881 ජූලි මස 29 වන දින හිලන්මැසි කණ්ඩායමක් වශයෙන් ආරම්භ කරන ලද කණ්ඩායම පසුකාලීනව එනම් 1911 ජූනි මස 13 දින ලංකා වෛද්‍ය බළකාය ලෙස නම් විය. ශ්‍රී ලංකා ස්වේච්ඡා වෛද්‍ය බළකායේ ආරම්භය එය විය. 1892 ජූලි මස 12 වන දින ලංකා පාබල හමුදා අශ්වාරෝහක කණ්ඩායම නගාසිටුවන ලදී. මවුන්ටඩ් ඉන්ෆැන්ට්‍රි නමින් හැඳින්වූ මෙම පාබල අශ්වාරෝහක කණ්ඩායම 1906 දී සිලෝන් මවුන්ටඩ් රයිෆල් නමින් වෙනම බළඇණියක් වශයෙන් ක්‍රියා කළ අතර මෙය 1937 දී විසුරුවා හරින ලදී. පාබල හමුදා ඉංජිනේරු කණ්ඩායම වශයෙන් ක්‍රියාකළ එම කණ්ඩායම 1911 සෙන්ත්‍රු ඉංජිනේරු කණ්ඩායමක් වශයෙන් ප්‍රතිසංවිධානය කරන ලද අතර පසුව එය සිලෝන් ඉංජිනියර්ස් නම් විය. 1910 දී ස්වේච්ඡා බළකාය ලංකා ආරක්ෂක බළසේනාව (CEYLON DEFENCE FORCE) වශයෙන් ප්‍රතිසංවිධානය විය.

1922 ලංකා ආරක්ෂක බළසේනාව බ්‍රිතාන්‍ය රජයේ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය මගින් ගෞරවයට පාත්‍ර වන ලදී. මෙම වකවානුවේදී ඇතිවූ විශේෂිතම සිදුවීම වන්නේ 1922 මාර්තු මාසයේදී අති උත්තම එඩ්වඩ් වේල්ස් කුමාරයා (පසුව අටවන එඩ්වඩ් රජතුමා) ලංකාවට පැමිණීමයි. මෙම අවස්ථාවේදී ලුතිනන් කර්නල් ටී පී ජයවර්ධන VD ලංකා පාබල හමුදාවේ ප්‍රථම ලාංකික අණදෙන නිලධාරී වූ අතර ලංකා පාබල හමුදා ඒකකයට 1922 මාර්තු මස 22 වන දින රාජකීය වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය සිදු කරන ලදී.

ස්වේච්ඡා හමුදා සාමාජිකයින් ප්‍රථම වතාවට විදේශීය හමුදාමය කටයුතු සඳහා සිය දායකත්වය දක්වන ලද්දේ 1899 පාබල හමුදා අශ්වාරෝහක කණ්ඩායම දකුණු අප්‍රිකාවේ බෝයර් යුද්ධයට සහභාගීවීමෙනි. 1914 සිට 1918 දක්වා පළමු වන ලෝක සංග්‍රාමය යටතේ විදෙස් යුද සේවා කටයුතු සඳහා ස්වේච්ඡා සෙබළුන් 100 ක සංඛ්‍යාවක් වෙනත් යුද පෙරමුණුවල සේවය කිරීමට තෝරාගෙන තිබුණත් එය අවලංගු විය. ඊට හේතුව වූයේ රටේ අභ්‍යන්තර ආරක්ෂාව සඳහා සෙබළුන් රඳවා ගැනීම අවශ්‍ය වූ බැවිනි. එයින් සෑහීමකට පත් නොවූ ස්වේච්ඡා හමුදා සාමාජිකයින් ඔවුන්ගේ දැඩි කැමැත්ත මත නිලධාරීන් 11 දෙනෙකු සහ සෙසු නිලයින් 73 දෙනෙකු බ්‍රිතාන්‍ය ඒකකවලට බැඳී යුරෝපයේ සටන් පෙරමුණුවල විශිෂ්ට සේවාවල නිරතවී ඇත. දෙවන ලෝක යුද සමයේ නව බළඇණි කිහිපයක් නැවත ආරම්භ කරන ලද අතර ඒවා නම් කොළඹ නගර ආරක්ෂක බළකාය, තැපැල් හා විදුලි සංදේශ බළකාය, රේල්වේ ඉංජිනියරිං කෝ, සිලෝන් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් මිකැනිකල් කෝ යන බළඇණි වේ. එසේම ටෙරිටෝරියල් සර්විස්ද 1943 වර්ෂයේදී ආරම්භ කර 1946 දී විසුරුවා හරින ලද අතර එය ලංකා ආරක්ෂක බළසේනාවේ ප්‍රථම කාන්තා බළකාය විය. ද සිලෝන් කෝ මිලිටරි පොලිස් 1944 දී ආරම්භ කර 1946 දී විසුරුවා හැර ඇති අතර ද සිලෝන් සිග්නල් 1943 දී ආරම්භ කර ඇත.

1948 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග 1949 වර්ෂයේදී නිත්‍ය හමුදාව ආරම්භ වන තෙක් මූලාරම්භයේ සිට එවකට පැවති බොහෝ බළඇණි වරින් වර විවිධ හේතූන් මත විසුරුවා හැර ඇති අතර ස්වේච්ඡා බළසේනාවේ සංවිධානය හා සංයුතිය ද වරින් වර වෙනස්වීම්වලට භාජනය වී ඇත. ලංකාවට නිදහස ලැබූ මුල් කාලයේ ස්වේච්ඡා බළකායේ කැපී පෙනෙන අවස්ථා දෙස බැලීමේදී 1953 හර්තාලය පාලනය කිරීම සඳහා සක්‍රීය සේවා රාජකාරී ඉටුකිරීම හැඳින්විය හැක. එසේම 1954 බ්‍රිතාන්‍ය මහ රැජිනගේ පැමිණීම හා එම අවස්ථාවේ ගාලු මුවදොර පිටියේදී 2 වන ලංකා පාබල හමුදාව වෙත රැජිනගේ හා බළකා වර්ණ ප්‍රදානය ඉතා උත්කර්ෂවත් උත්සවයකදී සිදු කෙරුණු අතර, 1980 අගෝස්තු මස 15 වන දින 2 වන හා 3 වන (සෙව්) ගැමුණු සේවා බළකා වෙත ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ පිරිනැමිණි.

1972 මැයි මස 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශ කිරීමත් සමග එතෙක් "ලංකා ස්වේච්ඡා බළකාය" නමින් හැඳින්වූ නාමය වෙනස් වී එය "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව" ලෙස නාමකරණය විය. මේ හේතුවෙන් ඒකකයන්ගේ නාමයන්ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ පිළිවෙල අනුව සැකසිණ. වර්තමානය වන විට එය ඒකක 65 කින් සැදී 48000 කට ආසන්න භට පිරිසකගෙන් පරිපූර්ණ වී ඇත. ආරම්භක අවදියේ සිට රටේ අභ්‍යන්තරික වශයෙන් ආරක්ෂක කටයුතුවල නියැලුණු අතර යුදමය අවස්ථාවල දී රට අභ්‍යන්තරයේ මෙන්ම විදේශීය යුදමය තත්වවලදී ද ස්වේච්ඡා බළසේනාවට අයත් භට පිරිස් සක්‍රීය යුද සේවය සඳහා කැඳවා ඇත.

නැවත 1983 වර්ෂයේ සිට මේ දක්වා ස්වේච්ඡා බළසේනාව අඛණ්ඩව සක්‍රීය සේවයේ යෙදී සිටිමින් නන්දිකඩාල් කලපුවෙන් අවසන් ත්‍රස්තවාදියා විනාශයට පත්කරන තෙක් තම මව්බිම වෙනුවෙන් සිය සක්‍රීය දායකත්වය ලබාදෙන ලදී. ගෙවී ගිය තිස් වසක යුද ඉතිහාසය තුළ ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් රණබිමේ දී කළ කැපකිරීම් අපමණය. එහිදී ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ ප්‍රථම වරට පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ නිලධාරියා ලෙසින් කපිතාන් සාලිය අලදෙනිය ඉතිහාසයට එක්විය.

එකී යුග මෙහෙවරේදී සිය රණකාමීබව පෙන්වූ ස්වේච්ඡා බළසේනාවට අයත් නිලධාරීන් 140 දෙනෙකු හා සෙසුනිලයින් 3790 ක් රට වෙනුවෙන් තම ජීවිත පූජාකර ඇති අතර, නිලධාරී 168 දෙනෙකු හා සෙසුනිලයින් 3642 ක් රණගාමිත තත්වයට පත්ව ඇත.

යම්කිසි සංවිධානයක සාර්ථකත්වය මැනිය හැකිවනුයේ එම සංවිධානය තුළින් ඉටුකෙරෙන සේවාව මත නම් යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව උච්ඡස්ථානයක පවතිනුයේ එවකට එහි සිටි බොහොමයක් සාමාජිකයින් විසින් ලබාදුන් උදාර දායකත්වය නිසාවෙන් බව පැහැදිලි වේ.



පරම වීර විභූෂණලාභී ප්‍රථම හමුදා නිලධාරී
කපිතාන් සාලිය අලදෙනිය PWV


ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ධුරය දැරූ මහාමාත්‍ය ඩී. එස් සේනානායක, ජෙනරාල් සර් ජෝන් කොතලාවල මැතිතුමන් වැනි ශ්‍රී ලංකාව තුළ බිහිවූ අග්‍රගණ්‍ය නායකයන් රැසක් ස්වේච්ඡා බලසේනාවෙන් බිහිව තිබීම ස්වේච්ඡා සාමාජිකයන් වූ අපට ආඩම්බර විය හැකි කරුණකි. තවද ශ්‍රී ලංකාවේ එදා මෙදා තුර ඔලිම්පික් පදක්කම් දිනූ ඩන්කන් වයිට්, සුසන්තිකා ජයසිංහ වැනි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ද ස්වේච්ඡා බලසේනාවෙන් කෙළිබිමට පිවිසි අයවළුන් වීමද ශ්‍රී ලංකාවේ විශාලතම කළමනාකරණ ව්‍යුහය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ස්වේච්ඡා සාමාජිකයන් වශයෙන් ගණකාධිකාරින්, නීතිවේදීන්, වෛද්‍යවරුන් ඇතුළු විවිධ වෘත්තිකයෙවදීන් විවිධ රාජකාරිවල නියුක්ත කරවීමට හැකි වීමද මෙම බලසේනාවේ අභිමානය ඉහළට ඔසවා තැබීමට හේතු වී ඇත.

2016 වර්ෂයේදී සාලාව යුද්ධ හමුදා කඳවුරු පරිශ්‍රයේ සිදුවූ ව්‍යසනයේදී ස්වේච්ඡා බලසේනා මූලස්ථානය බරපතල ලෙස හානියට ලක් වුවද, එම භෞතික විනාශය හමුවේ ස්වේච්ඡා බලසේනාවේ අභිමානය කිසිසේත් බිඳහෙළිය නොහැකි විය. එය පෙරට වඩා ශක්තිමත්ව ගොඩනැගෙමින් අද වන විට වත්මන් ස්වේච්ඡා බලසේනා සේනාධිනායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලුගේ USP nps psc ගේ මඟපෙන්වීම මත අංගසම්පූර්ණ කඳවුරක් සේ ගොඩනැගීමට අදාළ ඉදිකිරීම් සිදුකරමින් පවතී. ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාධිනායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාරගේ අධීක්ෂණයද, සියලු ස්වේච්ඡා සාමාජික සාමාජිකාවන්ගේ සාමූහික කැපවීමද එහි සාර්ථකත්වය පිටුපස යෝධ ශක්තියක් බවට පත්ව ඇත. එසේම වසර 144ක ප්‍රෞඪ ඉතිහාසය තුළ ස්වේච්ඡා බලසේනාවේ සාර්ථකත්වය උදෙසා සේනාධිනායකවරුන් 59 දෙනෙකු හා නියෝජ්‍ය සේනාධිනායකවරුන් 33 දෙනෙකු විසින් ඔවුන්ගේ කාලය ශ්‍රමය කැපකොට ලබාදුන් නායකත්වය විශිෂ්ට වේ.

එවන් වූ සුවිශේෂී දායකත්වයක් තුළින් සියවසකුත් අඩසියවසකට ආසන්න කාලයක් මුළුල්ලේ අභිමානවත්ව ගොඩනැගුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව රණබිමෙහි, කෙළිබිමෙහි මෙන්ම වෘත්තීමය හමුදාවක් ලෙසින් මාතෘභූමියේ සංවර්ධනාත්මක ඉලක්ක සාක්ෂාත්කරණය උදෙසා වර්තමානයේදීද සිය දායකත්වය ලබාදෙන අතර වර්තමානයේ ක්‍රියාත්මක "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන වෙනුවෙන් ද ඇපකැපවී තම රාජකාරී ඉටුකරයි. ස්වේච්ඡා බලසේනාවේ 144 වසරක ගමන් මඟෙහි අභිමානය මෙසේ ආවර්ජනය කර සිටිමු.



ඔලිම්පික් රිදී පදක්කම්ලාභිනී
සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව



ප්‍රථම ශ්‍රී ලාංකික ඔලිම්පික් රිදී පදක්කම්ලාභී
ඩන්කන් වයිට් ක්‍රීඩකයා



# 144 වන සංවත්සරයට සමගාමීව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත සත්කාරයක් ...







ස්වේච්ඡා බලසේනාවේ 144 වන සංවත්සර දිනයට සමගාමීව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළ අතර මාර්තු මස 25 වන දින පහත්ගම, හංවැල්ල ප්‍රදේශයේ පිහිටි සැදෑ සෙවණ වැඩිහිටි නිවාස භූමියෙහි ශ්‍රමදානමය කටයුත්තක් සිදුකළ අතර, 26 වන දින එම නිවාසයේ නේවාසිකව සිටින 60 කට අධික වැඩිහිටියන් වෙනුවෙන් නියෝජ්‍ය සේනාවිධායකතුමන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය විසින් දිවා ආහාරය හා අතවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම සිදුකරන ලදී. එමෙන්ම ඔවුන්ගේ විනෝදාස්වාදය වෙනුවෙන් අප සාමාජිකයින් විසින් සංගීතමය වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.







# 144 වන සංවත්සරය ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සැමරූ වගයි ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 144 වන සංවත්සරය වෙනුවෙන් සෙත් පිරිත් සජ්ඣායනාමය පිංකමක් හා දානවල් සංඝගත දක්ෂිණාමය පිංකමක් පවත්වන ලදි. ස්වේච්ඡා බලසේනා සමාජිකයන් ලෙස මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ විරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කිරීමටත් රණක්ෂිතයට පත්ව සිටින සියලුම රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත් වර්තමානයේදී රාජකාරී කරන ස්වේච්ඡා බලසේනා සේනාවිධායක, නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු සියලුම සමාජිකයන්ට සෙත් ප්‍රාර්ථනා කිරීමටත් මෙම සංවත්සර දින පිංකම් මාලාව සංවිධානය කරන ලදි.



මේ සඳහා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc, ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ඇතුළු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් මෙන්ම ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ සෙසුනිල සාමාජිකයන් ද සිවිල් සේවක මහතුන් ද සහභාගී වූහ.







ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සරය වෙනුවෙන් පැවති ආගමික වැඩසටහන් මාලාවේ කතෝලික ආගමික ආශිර්වාද පූජාව මාර්තු මස 24 වන දින කළුඅග්ගල විස්ෂෝප මාතා දේවස්ථානයේදී සිදුකරන ලදී.





වර්ෂ 1881 දී ආරම්භය සනිටුහන් කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවට වසර 144 ක් සැපිරීම නිමිත්තෙන් පැවැත්වූ ආගමික වැඩසටහන් මාලාවේ ඉස්ලාම් ආගමික ආශිර්වාද පූජාව මාර්තු මස 24 වන දින හංවැල්ල ප්‍රධාන ඉස්ලාම් දේවාස්ථානයේදී පවත්වන ලදී.



# ස්වේච්ඡා බළසේනාවේ

## 144 වන සංවත්සරය

වර්ෂ 1881 දී ලංකාවේ ප්‍රථම හමුදාව ලෙස ආරම්භ වූ ස්වේච්ඡා බලසේනාවේ 144 වන සංවත්සර සැමරුම වෙනුවෙන් ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc වෙත, එකම ස්වේච්ඡා රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භට පිරිස් විසින් සිදුකරන ලද යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු ආරක්ෂක මුරයකින් හා වර්ණවත් සම්මාන මුරයකින් ගෞරවය පුදකරන ලදී. සංවත්සර දින වැඩසටහනේ නිමාව සනිටුහන් කරමින් සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදී.

**අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සර සැමරුම අප්‍රියෙල් මස 01 වන දින ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මූලිකත්වයෙන් අර්ථාන්විත ලෙස සිදුකරන ලදී.**















# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ ධජය

ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සර සැමරුම් විශේෂ කලාපය තුළ අපට අභාෂ වූ කහ සහ කළු වර්ණවලින් සමන්විත ධජය පිළිබඳව සංක්ෂිප්ත සටහනක් තබමු. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවට අයත් ධජය දිගින් අඩි 06 කි. එහි පළල අඩි 3 1/2 ක් වේ. ධජයේ පසුතලය කහ පැහැයෙන් යුක්තය. එහි මැද කළු පාටින් යුත් ඇතෙක් හොඬය ඔසවා ආචාර කිරීමේ ඉරියව්වෙන් සිටී. ඇත් රූපය වටා සුදු පාටින් යුත් සිහින් ඉරක් ඇත. ඇතාට පහළින් කතිරයක හැඩයට සමාන වන අයුරින් තැබූ අසිපත් දෙකක් ඇත. අසිපත් දෙකට පහළින් දිග හරින ලද පුස්කොළ පොතක හැඩය ගත් පසුබිමේ "ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාව" යනුවෙන් සඳහන් කොට ඇත. ස්වේච්ඡා බළසේනාව ආරම්භ කළ අවදියේ ලංකාව පාලනය කළ ආණ්ඩුකාරවරයා සිය රටේ එවකට පදිංචිව සිටි ප්‍රාන්තයේ ආරක්ෂක කටයුතු සිදු කළ "හයිලන්ඩ්" බළඇණියේ සෙබළුන් විසින් අඳින ලද "කිල්ට්" නැමති නිළ ඇඳුමේ කහ සහ කළු වර්ණයන් මෙම ධජයට එක්කර ඇති බවට මතයක් ඇත. 1835 වර්ෂයේ සිට (එවකට මෙරට හැඳින්වූයේ "සිලෝන්" යන නාමයෙනි.) රාජ්‍ය ආධිපත්‍ය පිළිබිඹු කරන ලද්දේ හොඬය ඔසවාගත් හස්ති රාජයෙකු යොදවීමෙනි. ඒ වන විට ලංකාවේ ස්ථිර හමුදාවක් නොතිබුණත් ලංකා පොලීසිය ස්ථාපිත වී තිබුණි. ලංකා පොලීසියට අයත් ධජයෙහි ද මෙම හොඬය ඔසවාගත් ඇතා පිළිබිඹු කර ඇත. වෙනත් රාජ්‍ය ආයතන ලාංඡනවලටද එකල මෙම ඇත් රූපය යොදා ඇති බවට සාක්ෂි ඇත.

නිදහස ලැබීමෙන් පසු 1972 ජනරජ ව්‍යවස්ථාව නීතිගත කිරීමෙන් පසු ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාව යන්න ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාව වශයෙන් සංශෝධනය කර සටහන් කර ඇත. තවද එවකට තිබූ මෙම ධජයෙහි ඇති අසිපත් කාලානුරූපීව විවිධ වෙනස්කම්වලට භාජනය වීමෙන් පසු එකල ධජයෙහි යොදා තිබූ බ්‍රිතාන්‍ය යුද හමුදාව භාවිතා කළ අසිපත් වෙනුවට වත්මන් ධජයෙහි උඩරට සෙන්පතියන් භාවිතා කළ අසිපත් යොදා ගැනීම තුළින් ද ශ්‍රී ලංකාවට ආවේණික අයුරින් එම වෙනස්කම් සිදුකර ඇති බව පැහැදිලි වේ. මුල්කාලීනව ස්වේච්ඡා බළසේනාව භාවිත කළ ලාංඡනවල ද ඒ ඒ වකවානුවලදී විවිධ වෙනස්කම් තිබූ බවට ද පැහැදිලි සාක්ෂි තිබේ. ඒ අතර, යුද හමුදා මූලස්ථානය විසින් 1952 වර්ෂයේ නොවැම්බර් මස ප්‍රකාශයට පත් කර ඇති "The Ceylon Army Journal" යන සඟරාවේ 37 වන පිටුවේ Cyril Van Langenberg විසින් ලියූ The Volunteer Force යන ලිපියට යොදා ඇති ස්වේච්ඡා බළසේනා ලාංඡනයෙහි හොඬය උඩට ඔසවාගත් ඇතෙක් ද ඊට පහළින් කතිරයක හැඩයට සමාන වන අයුරින් තැබූ අසිපත් දෙකක්ද සටහන් වන අතර, එය වටා ඇති රවුමෙහි Ceylon Defence Force යනුවෙන් ඉංග්‍රීසියෙන් සටහන් කර ඇත. එම ලාංඡනයේ හරි මැද ඉහළින් ඔටුන්නක් ද දක්නට ලැබෙන අතර, පසුකාලීනව එම ඔටුන්න ද ලාංඡනයෙන් ඉවත් වී ඇත.

# රණවරුණ

## අධීක්ෂණය



බ්‍රිගේඩියර්
බී එම් ආර් ජේ බණ්ඩාර

## උපදේශකත්වය



කර්නල්
ටී එස් බී ආර් ප්‍රනාන්දු

## සංස්කාරක



ලුතිනන් කර්නල්
එච් ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජොආබමු

## රණවරුණ කාර්ය මණ්ඩලය

**සහය සංස්කාරක/සෝදුපත් කියවීම**
මේජර් ඩී එම් දිල්හාරා සජීවනී ජාම්බ

ඔනි II ජයතිලක ඊඩීඑන්ආර් (සම්බන්ධීකරණය)
කෝප්‍රල් කීර්තිරත්න ඩීඩබ්ලිව්ටීඩබ්ලිව්ඩී (පරිගණක නිමැවුම්)
ලා/කෝප්‍රල් මෛත්‍රීවර්ධන බීසීජේ (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් රණසිංහ ආර්ඒපීඩබ්ලිව් (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්ඩබ්ලිව් (ඡායාරූප)
ලා/කෝප්‍රල් ඇතුගල්පිටිය එච්එන්එම් (ඡායාරූප)

**රණවරුණ ලිපිනය**

සංස්කාරක,
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද්ධ හමුදා කඳවුර,
සීතාවක - හෝමාගම

වෙබ් slavf@army.lk

ඊමේල් ranawaruna@yahoo.com

දුරකථන 036 2255 362

මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස්

# සංස්කාරක සටහන

සියවසක් ඉක්මවා තවත් අඩසියවසකට ආසන්න අභිමානනීය ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 144 වන සංවත්සරය අප්‍රියෙල් මස පළමුවන දිනට යෙදී ඇත. අප්‍රිකානු බෝයර් යුද්ධය, පළමු සහ දෙවන ලෝක සංග්‍රාම මෙන්ම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වූ අවස්ථාවල හා වසර 30 ක සිවිල් යුදමය වාතාවරණය තුළදී තම රාජකාරිය නොපිරිහෙලා ඉටුකළ අතීත පරපුරක සොල්දාදුවන් පිරිසකගෙන් සැදුම්ලත් කණ්ඩායමක වර්තමාන සාමාජිකයන් ලෙස ස්වේච්ඡා බළසේනාව පිළිබඳව සිහිපත් කිරීම අප සියලු දෙනාගේ යුතුකමකි.

වර්ෂ 1881 ක් වූ අප්‍රියෙල් මස පළමු වන දින ස්වේච්ඡා හමුදාවක්, Ceylon Volunteers, නමින් ස්ථාපනය වූ අතර ආරම්භයේදී පාබල බළඇණියක් වූ මෙය පසුව අශ්වාරෝහක කණ්ඩායමකින්, කාලතුවක්කු කණ්ඩායමකින්, ගිලන්මැසි කණ්ඩායමකින්, ඉංජිනේරු කණ්ඩායමකින් හා තූර්ය වාදක කණ්ඩායමකින් හා ශිෂ්‍යභට කණ්ඩායමකින් සමන්විතව එවක රටෙහි පැවති අවශ්‍යතා සම්පූර්ණ කරන ලදී.

එක් පාබල බළඇණියකින් ආරම්භ වූ පසුව සිලෝන් වොලන්ටියර්ස්, "ලංකා ආරක්ෂක බළසේනාව" ලෙසත්, "ලංකා ස්වේච්ඡා බළසේනාව" ලෙසත් ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමත් සමඟ "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව" ලෙසත් නාමකරණය විය.

ශ්‍රී ලාංකේය දේශයේ සහ ජාතියේ ආරක්ෂකයා ලෙස සැලකෙන යුද හමුදාවේ ස්වේච්ඡා සාමාජිකයන් ලෙස අභීතව ඉදිරිපත් වී ශ්‍රී ලාංකීය ජන ජීවිතය යථා තත්වයට පත් කිරීමටත් අවස්ථානුකූලව ආරක්ෂාව තහවුරු කිරීමටත් රටේ සංවර්ධන කාර්යයන්ට දායකත්වය ලබා දීමටත් කැපවන සොල්දාදුවන්ගෙන් සමන්විතවූ 144 වන සංවත්සර සැමරුම් දිනයේදී අවධාරණය කළයුතුව ඇත. එදා, අද මෙන්ම හෙටත් එම ගෞරවනීයබව දිවිහිමියෙන් ආරක්ෂා කිරීමටත් මාතෘ භූමිය වෙනුවෙන් තම සේවය ඉටුකිරීමටත් ස්වේච්ඡා සාමාජිකයන් ලෙස වගකීමෙන් බැඳී සිටිය යුතු බව අප සියලු දෙනා සිතට ගතයුතු කරුණකි.




# නව නායකත්වයක්, ස්වේච්ඡා බළසේනාවට ශක්තියක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 60 වන සේනාවිධායක ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායේ මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc පෙබරවාරි මස 13 වන දිනට යෙදුණු සුබ මොහොතින් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් රාජකාරී භාරගන්නා ලදී.

දේශයේ නිදහස් නිවල්භාවය උදෙසා තම ජීවිතය පූජා කළ විරුවන් සිහි කරමින් කපිතාන් සාලිය අලදෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ නව සේනාවිධායකතුමන් වෙත ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භට පිරිස් විසින් පිරිනමන ලද කැඩවුරු මුරයකින් හා අභිමානවත් සම්මාන මුරයකින් ගෞරවය පුදකළහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර විසින් නව සේනාවිධායකතුමන් උණුසුම්ව පිළිගත් අතර එහිදී තම රාජකාරී භාරගැනීම සනිටුහන් කිරීම සඳහා සේනාවිධායකතුමන් විසින් දූරියන් පැළයක් රෝපණය කිරීමෙන් අනතුරුව භටපිරිස් ආමන්ත්‍රණය කරන ලදී.





වසර 34 කට අධික යුද හමුදා සේවා කාලයක් හිමි ක්‍රියාන්විත මෙන්ම අණ හා මාණ්ඩලික රාජකාරි අත්දැකීම් සහිත මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ස්වේච්ඡා බලසේනාවෙහි සේනාවිධායක ලෙස පත්වීම, ස්වේච්ඡා සාමාජිකයන්ට ඉමහත් ගෞරවයක් සේ සලකන අතර ස්වේච්ඡා බලසේනාවේ ඉදිරි ප්‍රගමනයට ඔබතුමන්ගේ නායකත්වය හේතුවනු ඇතැයි අපේක්ෂා කරමු. නව සේනාවිධායකතුමනි, ඔබතුමන්ට රණවිරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක්කර සිටිමු.









# සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක්





ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රාජකාරී නියුතු නිලධාරී සහ සෙසුනිලයින්ගේ රාජකාරී මානසිකත්වයෙන් මිදී කණ්ඩායම් හැඟීම වර්ධනය කරමින් සුහදතාව වෙනුවෙන්, සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පෙබරවාරි මස 24 සහ 25 යන දිනවලදී ස්වේච්ඡා බළසේනා මූලස්ථාන ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී.

කණ්ඩායම් 8ක් තරඟ වැදුණු එම තරඟාවලියේ අවසන් මහා තරඟයේදී ප්‍රධාන ශාඛා කණ්ඩායම පරාජය කරමින් සමස්ත ශූරතාව දිනාගැනීමට පාලන ශාඛා කණ්ඩායමට හැකිවිය.

සමාප්ති උත්සවයට සහභාගී වූ ස්වේච්ඡා බළසේනා වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc විසින් ජයග්‍රාහකයන් වෙත කුසලාන ප්‍රදානය කළ අතර ස්වේච්ඡා බළසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඩී එම් ආර් ජේ බණ්ඩාර ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසු නිල සාමාජිකයන් රැසක් මෙම තරඟාවලිය නැරඹීම සඳහා සහභාගී වූහ.



ශූරතා කණ්ඩායම



අනුශූරතා කණ්ඩායම



ශූරතා කණ්ඩායම - පාලන ශාඛාව



අනුශූරතා කණ්ඩායම - ප්‍රධාන ශාඛාව

# "ඩයිනර්ස් ක්ලබ්" වැඩසටහන



ස්වේච්ඡා බලසේනා නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කළ "ඩයිනර්ස් ක්ලබ්" වැඩසටහන, මාර්තු මස 04 වන දින ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී පවත්වන ලදී. එහිදී "ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී හමුදා නිලධාරීන් වශයෙන් වන වගවීම, වගකීම හා කාර්යභාරය" පිළිබඳ දේශනය මේජර් ජෙනරාල් සජිත් ලියනගේ USP nps psc විසින් සිදුකළේය. මේ සඳහා ස්වේච්ඡා බලසේනාවේ වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc, වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ඇතුළු ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ආරාධිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ස්වේච්ඡා බලසේනා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් පිරිසක් සහභාගී වූහ.













# 59 වන සේනාවිධායකගේ සම්ප්‍රාප්තිය ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 59 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ජනවාරි මස 05 වන දිනට යෙදුණු සුබ මොහොතින් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් රාජකාරි භාර ගන්නා ලදී. ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර විසින් නව සේනාවිධායකතුමන් පිළිගත් අතර ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භට පිරිස් විසින් කැඳවුරු මුරයකින් හා අභිමානවත් සම්මාන මුරයකින් එතුමන් වෙත ගෞරවය පුදකලහ. කපිතාන් සාලිය අලදෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ නව සේනාවිධායකතුමන් තම රාජකාරි භාරගැනීම සනිටුහන් කරමින් පැළ රෝපණයක්ද සිදුකරන ලදී. දීර්ඝ යුද හමුදා සේවා කාලයක් හිමි ක්‍රියාන්විත මෙන්ම අණ හා මාණ්ඩලික රාජකාරි අත්දැකීම් සහිත ඔබතුමන්, ස්වේච්ඡා බලසේනාවේ ඉදිරි ප්‍රගමනයට නායකත්වය සපයනු ඇතැයි අපේක්ෂා කරමු. නව සේනාවිධායකතුමනි, ඔබතුමන්ට රණවිරුණ ඔස්සේ මෙගේ සුභාශිංසන එක්කර සිටිමු.





# ස්වේච්ඡා බළසේනා 59 වන සේනාවිධායක ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ඒකක සංචාරයක





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා 59 වන සේනාවිධායක මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc විසින් ජනවාරි මස 16 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය - (මධ්‍යම) යටතේ ස්ථාපිත ස්වේච්ඡා ඒකක වන 5 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, 2 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 4 වන ශ්‍රී ලංකා යුධෝපකරණ බළකාය සහ 1 වන ශ්‍රී ලංකා රයිෆල් බළකාය වෙත සංචාරයක නිරත විය. එහිදී ඒකක අණදෙන නිලධාරීන් විසින් මෙම ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් උණුසුම්ව පිළිගන්නා ලදී.

එම සංචාර සිහිවීම පිණිස පැළ රෝපණ කිහිපයක් සිදු කළ සේනාවිධායකතුමන් හටපිරිස් ආමන්ත්‍රණය කළ අතර "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. මෙම අවස්ථා සඳහා ස්වේච්ඡා බළසේනා ජ්‍යේෂ්ඨ නිලධාරීන්, 11 වන පාබල සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ නිලධාරී ඇතුළුව බළඇණි නියෝජනය කළ ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.













# ගී සර මියැසිය



ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ මානසික ඉහිල්භාවය, මෙන්ම ගීත රසවින්දනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ජනවාරි මස 21 වන දින ගී සර මියැසිය මනෝ චිකිත්සාමය සෞන්දර්ය වැඩසටහන ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා වැඩබලන 59 වන සේනාවිධායක වූ මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc ගේ සංකල්පයක් මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ගේ සම්බන්ධීකරණය මත සිදුකළ මෙම දේශනය බෞද්ධ මනෝ චිකිත්සාව පිළිබඳ කැළණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් සිදුකරන ලදී.

ගීතවල ගැබ්වුණු මනෝභාවයන් ඉතා අර්ථවත් ලෙස මතුකරමින් එම ගීත පුද්ගලානුබද්ධව අප ජීවිත අත්දැකීම්වලට සම්බන්ධ කරමින් පැවැත්වූ මෙම දේශනයට ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ඇතුළු මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.











# අධ්‍යයන කටයුතුවලට ශක්තියක් වෙමින්...

2025 වර්ෂය සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහිදී පවත්වනු ලබන පාඨමාලා සඳහා සුදුසුකම් ලැබූ ස්වේච්ඡා බලසේනාවට අයත් නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් මූල්‍ය ප්‍රදානය කිරීම ජනවාරි මස 10 වන දින ස්වේච්ඡා බලසේනා 59 වන වැඩබලන සේනාවිධායක වූ මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. එහිදී රුපියල් 50000 බැගින් වූ මූල්‍යමය ත්‍යාග තෝරාගත් නිලධාරීන් කිහිප දෙනෙකු සඳහා සංකේතාත්මකව ප්‍රදානය කළ අතර මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් පේ බණ්ඩාර ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# 3 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත කළ සංචාරයක්







ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා වැඩබලන 59 වන සේනාවිධායක වූ මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc, 3 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ජනවාරි මස 14 වන දින සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් ජේ සමරනායක RSP විසින් සේනාවිධායක තුමා උණුසුම්ව පිළිගන්නා ලදී. සේනාවිධායක විසින් ඒකකයේ වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳව සොයා බලමින් කඳවුර නිරීක්ෂණයට ලක් කළ අතර හටපිරිස් ආමන්ත්‍රණය කළ සේනාවිධායක සමරු සටහන් පොතෙහි සිය අත්සනද තැබීය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී බ්‍රිගේඩියර් එස් කේ එම් එම් එස් කේ මහත්තේ KSP, ස්වේච්ඡා බලසේනාවේ මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.



# 59 වන සේනාවිධායකතුමන්ගේ රෙම ශ්‍රීලංජාආබමු සංචාරය





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා වැඩබලන 59 වන සේනාවිධායක වූ මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc පෙබරවාරි මස 05 වන දින කුරුණෑගල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වෙත සංචාරයක නිරත විය. එහිදී පසුකර යාමේ ආචාරයක් ලබාදී ගෞරවය පුද කළ අතර රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එන් එම් ජේ මංගල විසින් සේනාවිධායකතුමන් උණුසුම් ලෙස පිළිගන්නා ලදි. මිය ගිය රණවිරුවන් සිහිපත් කරමින් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ ස්වේච්ඡා බලසේනා සේනාවිධායකතුමන් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනෙහි වැදගත්කම සහ එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් කරමින් හටපිරිස් අමතා හරවත් දේශනයක් සිදුකරන ලදි. ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අයත් නිලධාරීන් විශාල පිරිසක් මේ සඳහා සහභාගී වූහ.





# 59 වන සේනාවිධායක නව තනතුරු ලැබ නික්ම යයි ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 59 වන වැඩබලන සේනාවිධායක ලෙස රාජකාරී ඉටුකළ මේජර් ජෙනරාල් ලංකා අමරපාල RWP RSP ndc psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස උසස්වීම් ලැබ පෙබරවාරි මස 10 වන දින සිය ධුරයෙන් සමුගන්නා ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර විසින් ස්වේච්ඡා බලසේනාවෙන් නික්මයන සේනාවිධායකතුමන් උණුසුම්ව පිළිගත් අතර හමුදා සම්ප්‍රදායානුකූල කදවුරු මුර පිරික්සුමකින් ගෞරවය පුදකිරීම සිදුවිය. කපිතාන් සාලිය අලුදෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර පිරිනැමීමෙන් අනතුරුව සේනාවිධායකතුමන් විසින් කටපිරිස් ආමන්ත්‍රණය කළේය. නික්මයන සේනාවිධායකතුමන් විසින් රාජකාරී භාරදීමෙන් අනතුරුව ස්වේච්ඡා බලසේනා සමරු සටහන් පොතෙහි තම සමරු සටහනද තබන ලදී. නව තනතුරු ලැබ ස්වේච්ඡා බලසේනාවෙන් සමුගත් සේනාවිධායකතුමනි, ඔබතුමන්ට රණවිරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක් කරන්නෙමු.

# යුද්ධ හමුදාවෙන් සමුගන්නා ස්වේච්ඡා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට උණුසුම් සුබ පැතුම් ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දීර්ඝකාලීන සක්‍රීය සේවයකින් පසුව විශ්‍රාම ලැබූ ස්වේච්ඡා බලසේනාවේ බ්‍රිගේඩියර් එච් එච් ජේ මංගල, ලුතිනන් කර්නල් ආර් පී ආර් ගමගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පෙබරවාරි මස 21 වන දින ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc හමුවිය. මේ අවස්ථාව සඳහා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ඇතුළු ස්වේච්ඡා බලසේනාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.



# නිලධාරීන් සඳහා පුහුණු දිනයක්....

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මගපෙන්වීම මත වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ජනිත් බණ්ඩාර ගේ මෙහෙයවීම යටතේ මූලස්ථාන නිලධාරීන් වෙනුවෙන් ශාරීරික පුහුණුව, සරඹ පුහුණුව හා ඉදිරිපත්කිරීම් ඇතුළත් පුහුණු දින වැඩසටහනක් මාර්තු මස 11 වන බදාදා දින ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී පැවැත්විය. නිලධාරීන්ගේ ඉදිරිපත්කිරීම් බ්‍රිගේඩියර් එච් ඒ කීර්තිනාථ RSP KSP psc ගේ අධීක්ෂණය යටතේ සිදු කළ අතර ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් පිරිසක් මේ සඳහා සහභාගී වූහ.











# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Colonel General Staff
SLAVF
Colonel
S M A D S P W Jayasekara RSP



Colonel Legal
SLAVF
Colonel
B C K Ferdinandez USP



Recruiting Officer
SLAVF
Colonel
I U K Wattegedara



Commanding Officer
HQ Bn - SLAVF
Colonel
H P D A Wijesekera



SO I (CP and Prom Cell Snr Offrs) HQ SLAVF
Lieutenant Colonel
B A K I K Bogoda RWP USP



SO I (RO)
HQ SLAVF
Lieutenant Colonel
A M M B Attanayake



Commanding Officer
2 SLAPC
Major
W L D L A Perera psc



Commanding Officer
1 SLAPC
Major
A M A P Abesinghe



Commanding Officer
5 SLLI
Major
K B G Aththanayaka



Commanding Officer
3 SLSR
Major
N Rathnayaka



Commanding Officer
2 SLLI
Major
M C Prasad psc



2 nd In Command
2 SLAPC
Major
A G G K Darmasena



SO II (IT)
Offr Br - HQ SLAVF
Major
Y N Wickramasinghe



SO II (Welfare)
HQ SLAVF
Major
S P D Ariyasinghe



GSO II (Trg)
HQ SLAVF
Major
K A D I E Ushantha psc



Chief Cleark
GS Br - HQ SLAVF
WO II Pathirana KKR

## 3 (සෙව්) ගැහේබ



මාතර කොටුවෙහි ස්ථාපිත 3 (සෙව්) ගැමුණු හේවා බළකාය විසින් තම 59 වන ඒකක සංවත්සරය ඒකක අණදෙන නිලධාරී මේජර් එච් පී ඩී සී තිලකරත්න ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරන ලදි. බළඇණි සංවත්සර දිනයට සමගාමීව සියලුම රණවිරුවන්ට සෙත් පතා බෝධි පූජාමය පිංකමක් පවත්වන ලද අතර පසුදින උදෑසන මහා සංඝරත්නය සඳහා හීල් දානමය පිංකමක් පැවැත්විය. එමෙන්ම අණදෙන නිලධාරීතුමන් හට කදවුරු සම්මාන මුරයකින් ගෞරවය පුදකිරීමෙන් අනතුරුව සියලු නිල සේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක්ද සංවිධානය විය.

## ඒකකයට වසර 59 යි ...





## ජන ජීවිතයට පිළිසරණක්

### 5 (සෙව්) ශ්‍රීලංසිරෙ





75 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරන නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ මාන්කුලම් ප්‍රදේශයේ ස්ථාපිත 5 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් තම ඒකක බළප්‍රදේශයේ පදිංචි පවුලක් සඳහා ඉදිකළ නව නිවස භාරදීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච් එල් වී එම් ලියනගේ RWP RSP ndu ප්‍රධානත්වයෙන් සිදුකළ අතර මෙම අවස්ථාවේදී එම නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ දරුවන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීම 59 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩී ආර් එන් හෙට්ටිආරච්චි RWP RSP USP විසින් සිදුකරන ලදි. 5 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් බී ජී ජේ ප්‍රේමතිලක ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකක හටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් මෙම ඉදිකිරීම සිදුකරන ලදි.

## 32 වන ඒකක සංවත්සරය

**15 ශ්‍රීලංජාආබමු**








15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 32 වන ඒකක සංවත්සරය දින තුනක් පුරා අභිමානයෙන් සමරන ලදී. එහිදී මිය ගිය හා රණකමිතයට පත් විරුවන් සිහිකරමින් බෝධිපූජාමය පිංකමක් හා දහවල් සංඝගත දක්ෂිණාමය පිංකමක් පැවැත්විය. මෙහිදී කඳවුරු ආරක්ෂක මුරයකින් ඒකක අණදෙන නිලධාරී මේජර් එස් එම් සී සමරසිංහ RSP වෙත ගෞරවය පුදකළ අතර එතුමන් විසින් පැළ රෝපණයක්ද සිදු කරන ලදී. සංවත්සර වැඩසටහනට සමගාමීව අත්පන්දු තරඟාවලියක් සංවිධානය කළ අතර සියලු නිල ෆේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක්ද පැවැත්විය. මේ සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් සියලු දෙනා සහභාගී වූහ.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධානිගේ සංචාරය

**2 (සේවා) ශ්‍රීලංසිරෙ**







ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ ඩී ඩබ්ලිව් නානායක්කාර RSP VSV USP ndu ජනවාරි මස 31 වන දින මහනුවර ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් ඒ එම් ඩී එස් තිලකරත්න විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර රෙජිමේන්තු අධිපති වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිළ සියලු දෙනා සහභාගී වූහ.

## 2 (සේවා) ශ්‍රීලපාහ

## රෙජිමේන්තු අධිපතිගේ ඒකක සංචාරය





කැළණිමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය ආඥාපති සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් වයි ඒ බී එම් යහම්පත් RWP RSP ndu psc ජනවාරි මස 08 වන දින සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් ඒ පී එන් ධනසිරි විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර කඳවුරු ආරක්ෂක මුරයකින් එතුමන් වෙත ගෞරවය පුද කළේය. එහිදී පැළ රෝපණයක්ද සිදු කළ රෙජිමේන්තු අධිපති ඒකක භට පිරිස් ආමන්ත්‍රණය කිරීමෙන් අනතුරුව සමරු සටහන් තබා සංචාරය නිමා කරන ලදී.

## 19 ශ්‍රීලංජාආබමු

## 11 වන පාබල සේනාංකාධිපතිගේ කඳවුරු සංචාරය







11 ව පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ඒ යූ කොඩිතුවක්කු RSP USP psc IG ලක්ෂපාන ප්‍රදේශයේ ස්ථාපිත 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත සංචාරයක් සිදුකරන ලදී. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් පී කේ එච් ගුණරත්න විසින් එතුමන් පිළිගත් අතර එහිදී සංචාරය සිහිවීම පිණිස පැළ රෝපණයක්ද සිදුකරන ලදී. එහිදී සේනාංකාධිපතිතුමන් විසින් භටපිරිස් ඇමතූ අතර මෙම අවස්ථාව සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

## 11 ශ්‍රීලංජාආබමු

## 241 වන පාබල බළසේනාධිපතිගේ ඒකක සංචාරය





241 වන පාබල බළසේනාධිපති කර්නල් ආර් එස් සී දිසානායක RSP විසින් අම්පාර ප්‍රදේශයේ ස්ථාපිත 11 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත සංචාරයක් සිදුකරන ලදී. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් පී සී හෙට්ටිආරච්චි විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර සංචාරය සිහිවීම පිණිස පැළ රෝපණයක්ද සිදු කරන ලදී. එහිදී බළසේනාධිපති විසින් හටපිරිස් අමතමින් ඒකකය වෙත පැවරී ඇති රාජකාරීමය කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීමක් සිදුකළ අතර මෙම අවස්ථාව සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

## 243 වන පාබල බළසේනාධිපතිගේ ඒකක සංචාරය

## 11 (සේවා) ශ්‍රීලංසිරෙ








243 වන පාබල බළසේනාධිපති කර්නල් කේ එම් යූ පී කළුපහන USP psc මඩකළපුව, කුරුක්කල්මඩම් හි පිහිටි 11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත නොවැම්බර් මස 08 වන දින සංචාරය කරන ලදී. ඒකක අණදෙන නිලධාරී මේජර් බී ආර් එම් පී ඩබ්ලිව් ඒ ආර් බලගල්ල විසින් එතුමන් පිළිගත් අතර සංචාරය සිහිවීම පිණිස පැළ රෝපණයක්ද සිදු කරන ලදී. එහිදී බළසේනාධිපතිතුමන් හටපිරිස් ආමන්ත්‍රණය කළ අතර මෙම අවස්ථාව සඳහා 243 වන බළසේනාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

9 (සේවා) ශ්‍රීලපාහ

# 31 වන සංවත්සරය සමරමින්





යාපනය ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව තම 31 වන ඒකක සංවත්සරය අභිමානයෙන් යුතුව සමරන ලදී. එහිදී මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ හා රණක්ෂිතයට පත් රණවිරුවන් මෙන්ම සුනාමි ව්‍යසනයෙන් ජීවිතක්ෂයට පත්වූවන් සිහිකරමින් බෝධි පූජාමය පිංකමක් පවත්වන ලදී. පසු දින ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච් ආර් ඩබ්ලිව් ආර් කුමාර වෙත කදවුරු සම්මාන මුරයකින් ගෞරවය පුදකළ අතර සංවත්සර දිනය සිහිවීම සඳහා පැළ රෝපණයක්ද සිදු කළ අණදෙන නිලධාරීතුමන් ඒකක භට පිරිස් ඇමතීමෙන් අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයකට හා දිවා භෝජන සංග්‍රහයකටද සහභාගී විය. මෙම වැඩසටහන සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

14 (සේවා) ගැහේබ



# අර්ථවත් වූ සංවත්සර දිනයක්

ඔඩ්ඩුසුඩාන්හි ස්ථාපිත 14 වන ගැමුණු හේවා බළකාය තම 28 වන ඒකක සංවත්සරය අභිමානයෙන් යුතුව සමරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් එච් එම් ඒ පී කේ දිසානායක වෙත කදවුරු ආරක්ෂක මුරයකින් ගෞරවය පුද කළ අතර පැළ රෝපණයක්ද සිදුකළ අණදෙන නිලධාරී විසින් භට පිරිස් ඇමතීමෙන් අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයකටද එක්විය.

සංවත්සර සැමරුමට සමගාමීව ක්‍රිකට්, වොලිබෝල් සහ කඹ ඇදීමේ තරඟාවලිද සංවිධානය කර ජයග්‍රාහී කණ්ඩායම් වෙත කුසලාන ප්‍රදානය අණදෙන නිලධාරීගේ සුරතින් සිදුකරන ලදී. රට වෙනුවෙන් දිවි පිදූ හා රණක්ෂිතයට පත් මෙන්ම සේවයේ නියුතු රණවිරුවන් සිහිකරමින් බෝධි පූජාමය පිංකමක්ද පැවැත්වූ අතර සංගීත සැඳෑවකින් පසුව සංවත්සර දින වැඩසටහන නිමා විය. මේ සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් සියලු දෙනා සහභාගී වූහ.





11 (සේවා) ශ්‍රීලංසිරෙ



# අසිරිමත් නත්තල් සැමරුම

කුරුක්කල්මඩම්හි ස්ථාපිත 11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් නත්තල් දිනයට සමගාමීව සංවිධානය කළ නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් හා පාසල් ළමුන් 60 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගියදා සංවිධානය කරන ලදි. මඩකලපුව ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ එම් ඇනිස්ටන් පියතුමන්ගේ ආරාධනයෙන් 243 වන පාබල බලසේනාධිපති කර්නල් කේ එම් යූ පී කළුපහන USP psc ගේ ප්‍රධානත්වයෙන් සිදුවූ මෙම සත්කාර්යය සඳහා ඒකක අණදෙන නිලධාරී මේජර් බී ආර් එම් පී ඩබ්ලිව් ඒ ආර් බලගල්ල ඇතුළු ඒකක සෙසුනිලයින් මෙන්ම ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූහ.








11 ශ්‍රීලංජාආබමු





# සංචාරයක වගතුග

අම්පාර ප්‍රදේශයේ ස්ථාපිත 11 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත 24 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච් සී එල් ගලප්පත්ති RWP USP සංචාරයක් සිදුකරන ලදි. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් පී සී හෙට්ටිආරච්චි විසින් එතුමන්ව උණුසුම්ව පිළිගත් අතර කඳවුරු ආරක්ෂක මුරයකින් ගෞරවය පුදකරන ලදි. සේනාංකාධිපතිතුමන් විසින් හටපිරිස් ආමන්ත්‍රණය කළ අතර මෙම අවස්ථාව සඳහා ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

# අර්ධ නිවාසය අංගසම්පූර්ණ නිවසක් බවට පත්වී

17 (සේවා) ශ්‍රීලපාහ



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වයෙන් හා ඒකකයේ ශ්‍රම දායකත්වයෙන් 17 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/ 16ඩී00388 ඔහි 11 දිසානායක කේඑම්එන්බී යන බළලත් නිලධාරීගේ අර්ධ නිවාසය සම්පූර්ණ නිවසක් ලෙස ඉදිකර භාරදීම ඒකක අණදෙන නිලධාරී මේජර් ම් වී එස් අයි ආර් විතානගේ RSP ගේ හා එම මැතිණියගේ ප්‍රධානත්වයෙන් ජනවාරි මස 12 වන දින සිදුකරන ලදී.

## කුසලතා විදහාපාමින්



දොඹගොඩ පිහිටි යුධෝපකරණ පුහුණු පාසැලේදී පවත්වනු ලැබූ 77 වන උපකරණ පාලන ජේෂ්ඨකොනොනි පාඨමාලාවට සහභාගී වී පාඨමාලාවේ දක්ෂතම සිසුවා ලෙස ප්‍රථම ස්ථානය දිනාගන්නට 5 වන ගජබා රෙජිමේන්තුවට අයත් සෙ/ පී101805 සැරයන් වෙදගෙදර ඩබ්ලිව්පීඩබ්ලිව්පී සමන් විය. ලබාගත් ජයග්‍රහණය පිළිබඳව ඒකක අණදෙන නිලධාරී මේජර් ඩී එස් වයි එල් කුරුවිට ඇතුළු සියලු නිලයින්ගේ සුභාශිංසනය රණවරුණ ඔස්සේ මෙසේ එක් කර සිටිමු.

## පොත් පරිත්‍යාගයක් ...



17 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/21ඩී0016 සැරයන් රණවීර බංඩා ආර්එම් යන ජේෂ්ඨකොනොනි විසින් ඒකකයේ සියලු සාමාජිකයන්ගේ පරිශීලනය සඳහා ඒකක පුස්තකාලය වෙත පොත් 100ක් පරිත්‍යාග කරන ලදී. ඒකක අණදෙන නිලධාරී මේජර් ම් වී එස් අයි ආර් විතානගේ RSP ගේ මැදිහත්වීම මත සිදුවූ මෙම පොත් ප්‍රදානය සඳහා ඒකකයේ දෙවන අණදෙන නිලධාරී මේජර් එස් ආර් ඒ ආර් ඩබ්ලිව් සමරක්කොඩිදු සහභාගී විය.

9 (සේවා) ශ්‍රීලපාහ

## රෙජිමේන්තු අධිපතිගේ ඒකක සංචාරය



ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය ආඥාපති සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් වයි ඒ බී එම් යහම්පත් RWP RSP ndu psc ජනවාරි මස 31 වන දින පලාලි ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් පී එල් එස් වික්‍රමසිංහ විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර කඳවුරු ආරක්ෂක මුරයකින් ගෞරවය පුද කරන ලදි. එහිදී පැළ රෝපණයක්ද සිදු කළ රෙජිමේන්තු අධිපති විසින් ඒකක හට පිරිස් ආමන්ත්‍රණය කළ අතර සියලු නිල තේ පැන් සංග්‍රහයකටද සහභාගි විය. මෙම අවස්ථාව සඳහා 52 වන පාබල සේනාංකාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම ඒකක සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.



## පොල් පැළ බෙදාදීමේ ප්‍රජාසත්කාර වැඩසටහන

12 ශ්‍රීලංජාආබමු





තොප්පිගල ප්‍රදේශයේ ස්ථාපිත 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විසින් තම ඒකක බලප්‍රදේශයට අයත් දිළිඳු පවුල් 25ක් සඳහා පොල් පැළ බෙදාදීමක් 232 වන පාබල බළසේනාධිපති කර්නල් ආර් ආර් සී කරුණාරත්න RWP ගේ ප්‍රධානත්වයෙන් කෝරලේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පෙබරවාරි මස 13 වන දින සිදු කරන ලදි. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් එම් ඒ පී හේරත් ගේ මෙහෙයවීම මත සිදුකළ මෙම සත්ක්‍රියාව සඳහා කෝරලේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරීන්, සිවිල් වැසියන් මෙන්ම ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

5 (සේවා) ශ්‍රීලංසිරෙ

# මාණ්ඩලික ප්‍රධානීගේ සංචාරය







ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ ඩී ඩබ්ලිව් නානායක්කාර RSP VSV USP ndu ජනවාරි මස 24 වන දින මාන්කුලම් ප්‍රදේශයේ ස්ථාපිත 5 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් ඩී ඒ ජේ ප්‍රේමතිලක විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර භට පිරිස් ආමන්ත්‍රණය කළ රෙජිමේන්තු අධිපති වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදි. එහිදී එතුමන් සියලු නිල තේ පැන් සංග්‍රහයකට සහභාගී වූ අතර මෙම අවස්ථාව සඳහා ඒකකයේ නිලධාරීන් සහ සෙසු නිලයින් සියලු දෙනා සහභාගී වූහ.

12 ශ්‍රීලංජාආබමු

# රෙජිමේන්තු අධිපති ඒකක සංචාරයක





ආරක්ෂක සේනා මූලස්ථානය - නැගෙනහිර ආඥාපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පී ආර් පතිරවිතාන USAWC psc පෙබරවාරි මස 01 වන දින තොප්පිගල ස්ථාපිත 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් එම් වී පී හේරත් විසින් එතුමන්ව උණුසුම්ව පිළිගත් අතර කඳවුරු ආරක්ෂක මුරයකින් ගෞරවය පුද කරන ලදි. එහිදී පැළ රෝපණයක්ද සිදු කළ රෙජිමේන්තු අධිපති විසින් ඒකක භට පිරිස් ආමන්ත්‍රණය කළ අතර සියලු නිල තේ පැන් සංග්‍රහයකටද සහභාගී විය. මෙම අවස්ථාව සඳහා ඒකකයේ සියලුම නිලධාරීන් සහ සෙසු නිලයින් සහභාගී වූහ.

# ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත සංචාරයක්

9 (සේවා) ශ්‍රීලපාහ





යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී (සේවා) කර්නල් ඩබ්ලිව් පී කේ එච් පතිරණ RWP RSP ජනවාරි මස 29 වන දින පලාලි ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් පී එල් ඒ වික්‍රමසිංහ විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර කඳවුරු ආරක්ෂක මුරයක් ලබාදී ගෞරවය පුදකළේය. එහිදී සංචාරය සිහිවීම පිණිස පැළ රෝපණයක් ද සිදු කළ බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී ඒකක හට පිරිස් ආමන්ත්‍රණය කිරීමෙන් අනතුරුව දිවා භෝජන සංග්‍රහයකටද එක්වන ලදි. මෙම අවස්ථාව සඳහා 51 වන පාබල සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන්, ඒකක නිලධාරීන් මෙන්ම සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

# රෙජිමේන්තු අධිපතිගේ කඳවුරු සංචාරය

11 ශ්‍රීලංජාආබමු







ආරක්ෂක සේනා මූලස්ථානය නැගෙනහිර ආඥාපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පී ආර් පතිරවිතාන USAWC psc අම්පාර ප්‍රදේශයේ ස්ථාපිත 11 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත ජනවාරි මස 31 වන දින සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් එම් ඒ ටී එස් බණ්ඩාර විසින් එතුමන් උණුසුම්ව පිළිගත් අතර කඳවුරු පසුකර යෑමේ සම්මාන මුරයකින් එතුමන්ට ගෞරවය පුදකරන ලදි. එහිදී රෙජිමේන්තු අධිපති විසින් හට පිරිස් ආමන්ත්‍රණය කරන ලද අතර මෙම අවස්ථාව සඳහා සියලුම ඒකක නිලධාරීන් සහ සෙසු නිලයින් සහභාගී වූහ.

# කායික හා මානසික යහපැවැත්මට මත්ද්‍රව්‍ය බලපාන අයුරු



මෙම ලිපියෙන් අද සාකච්ඡා කරන්නේ කායික හා මානසික ස්වස්ථතාවට අහිතකර ලෙස බලපාන මිදිරාබාධය ගැනයි. ආරෝග්‍යා පරමාලාභා යන්නෙන් කායික ස්වස්ථතාවය පිළිබඳවත්, සංතුට්ඨී පරමං ධනං යන්නෙන් මානසික ස්වස්ථතාවය පිළිබඳවත් විශ්වාසා පරමා ඥාති යන්නෙන් සමාජීය ස්වස්ථතාවය පිළිබඳවත්, නිබ්බාණං පරමං සුඛං යන්නෙන් ආධ්‍යාත්මික ස්වස්ථතාව පිළිබඳවත් බුදුදහම සාකච්ඡා කරයි. කායික නිරෝගීතාවය මානසික නිරෝගීතාවයට මෙන්ම මානසික නිරෝගීතාවය කායික නිරෝගීතාවයටත් බලපායි. එනම් පුද්ගල කායික මානසික යන දෙඅංශයේම නිරෝගීතාවය මනා පුද්ගල සංවර්ධනයක් සඳහා අවශ්‍ය වේ. මේ පිළිබඳව වන බෞද්ධ දාර්ශනික කරුණු හා මනෝ විද්‍යාත්මක කරුණු මෙන්ම වෛද්‍ය විද්‍යාත්මක කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කළහැක.

එනම් මේ පිළිබඳ වෛද්‍ය විද්‍යාත්මක අදහස් විමසන්නේ නම් දින ගණනක් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයෙකුට පළමුව මුහුණ පාන්නට සිදුවන සරල ප්‍රතිවිපාකය නම් මන්දපෝෂණයයි. ආහාර රුචිය පහවීමත්, අවශ්‍ය පෝෂණය සහිත ආහාර සඳහා වියදම් දරනවා වෙනුවට මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වියදම් දැරීම මෙයට එක් හේතුවකි. මත්ද්‍රව්‍ය සඳහා වන වියදම් හේතුවෙන් පුද්ගලයා දිළිඳුභාවයට පත්වීමද පෝෂණ ආහාර වේලක් නොගැනීමට හේතුවේ. මේ හේතූන් නිසා ආහාර ගැනීම අත්හැරෙන අතර එනිසාම ආමාශයික ප්‍රදාහය ඇතිවේ. සුරා දූර්ථයන් නිතරම අක්මා රෝගයෙන් පෙළෙයි. අක්මාවෙහි ඇතිවන දැඩි තදබව හා තුවාල එහි විශේෂ ලක්ෂණ වේ. මෙම අක්මා රෝගීන්ගේන් බොහෝ දෙනෙකු සෙංගමාලය රෝගයට ගොදුරුවන අතර ලේ වමනය සහ ජලගෝඨය ඇතිවී මරණයට පත්වේ. මන්දපෝෂණයේ ප්‍රතිඵලයක් ලෙස විටමින් "බී" පදාර්ථයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක ඌණතාව නිසා පර්යන්ත ස්නායු ප්‍රදාහයට සුරාදූර්තයා ගොදුරු වේ. ස්නායු දුර්වල වන හෙයින් ස්පර්ශ නොදැනී යන අතර සියුම් ස්පර්ශ වටහා ගැනීමට නොහැකි වේ. අධික මත්පැන් පානය හදවතට හානි කරන අතර හෘද පේශීන් දිගු කිරීම සහ එල්ලා වැටීම, අක්‍රමවත් හෘද ස්පන්දනය, ආඝාතය සහ අධික රුධිර පීඩනය මේ නිසා ඇතිවිය හැකිය. අක්මාවද හානියට පමුණුවන අතර මේද අක්මාව, මද්‍යසාර හෙපටයිටිස්, ෆයිබ්‍රෝසිස්, සිරෝසිස් යන රෝග තත්වයන් ඇති කරයි. මද්‍යසාර සහිත අග්න්‍යාශය විෂ සහිත ද්‍රව්‍යයන් නිපදවීමට හේතු වන අතර එමඟින් අග්න්‍යාශයේ භයානක ප්‍රදාහයන් ඇතිවිය හැකිය. අධික මත්පැන් පානය විවිධ වූ භයානක පිළිකා ඇති කරවීමට මඟ වන අතරම ප්‍රතිශක්තීකරණ පද්ධතිය දුර්වල කරයි. එමඟින් විවිධ ශාරීරික රෝග වැළඳීම වඩාත් පහසු කරන බව වෛද්‍ය විද්‍යාත්මකව සනාථ කර ඇත.

මදිරාබාධයට ගොදුරු වූ පුද්ගලයා ශාරීරික වශයෙන් පමණක් නොව මානසික වශයෙන්ද විවිධ ව්‍යාධීන්වලට ගොදුරු වේ. ඔහු මායා දර්ශන දකියි. ඒවා ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය විය හැකිය. මධ්‍යසාර මතිභ්‍රමය ඉතා වේගයෙන් වෙනස් වන විසංවිධිත වූ ව්‍යාකූලත්වයෙන් යුත් මානසික ක්‍රියාවලියකි. මද්‍යසාර අපස්මාර යන මෙම තත්වය මද්‍යසාර අපහරණයෙහි ප්‍රතිඵලයකි. මතකය ඉතා ප්‍රබල ලෙස විනාශ වීම තවත් එක් මානසික ව්‍යාධියකි. වර්නිකේගේ එන්සෙපල ව්‍යාධිය නමින් තවත් ආපදාවකි. එහිදී අවධානය යොමු කිරීමේ අපහසුව ඇතිවන අතර යමකට පිළිතුරු සැපයීම ඉතා අඩු වේගයකින් සිදු කරයි. මද්‍යසාර විමනස්සය යනුවෙන් හඳුන්වන්නේ මත්ද්‍රව්‍ය පානයේ ප්‍රගතියත්

සමඟ ඇතිවන බුද්ධියේ පරිහානියයි. අනෙකා පිළිබඳ සැකයත් අධික ඊර්ෂ්‍යාවත් ඇතිවීම මෙහි තවත් ප්‍රතිඵලයක් වන අතර එය ව්‍යාධිවේදීය අනුයාම නමින් හැඳින්වේ. මද්‍යසාර භ්‍රාන්තිය මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන තවත් එක් මනෝ ව්‍යාධියක් වන අතර ඉහතින් සඳහන් කළ සියලු මනෝ ව්‍යාධීන් අධික මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵල ලෙස විස්තර කළ හැක.

දියුණුවන අහිතකර රස තණ්හාව නිසා මත්පැන් පානයට ඇබ්බැහිවීමක්ද සිදුවේ. එහි පෙලඹවීමේ ශක්තිය එතරම්ම ප්‍රබලය. මේ සඳහා ගිජු වූවෙකුට සිදුවිය හැකි අනර්ථයන් ද බුදු දහමෙහි දේශනා කොට ඇත.

1. මෙලොවදීම සිදුවන ධන හානිය
2. නොයෙක් කලහවලට පැටලීමට සිදුවීම
3. රෝගාබාධයන්ට ලක්වීම
4. අපකීර්තියට ලක්වීම
5. ලැජ්ජාව නොමැති තැනැත්තෙකු වීම
6. ප්‍රඥාව දුබල වේ.

මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන පරිහානිය, විනාශය ලෞකික ලෝකෝත්තර වශයෙනුත්, පුද්ගල, පවුල්, සමාජ වශයෙනුත් සිදුවන අතර මදිරාබාධය වර්තමාන සමාජයට ඉමහත් විනාශකාරී ප්‍රතිඵල අත්කර දෙමින් පැතිර යන අතර පුද්ගල කායික හා මානසික සෞඛ්‍ය කෙරෙහි ඉතා අහිතකර ලෙස බලපෑම් ඇති කරන බව විද්‍යාත්මකවත්, බෞද්ධ ඉගැන්වීම් අනුවත් පැහැදිලි කරගත හැකිය.

මදිරාබාධයෙන් පුද්ගලයා මුදවා ගැනීම බෞද්ධ මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක් හරහා සාර්ථකව ඉටු කිරීමේ හැකියාව පවතී. පුද්ගලයා ක්‍රමික පියවරයන් ඔස්සේ පුද්ගලයා තුළ "සතිය" වර්ධනය කිරීම මේ සඳහා අවශ්‍ය වේ. සතිය වර්ධනය කර ගැනීමට, ජීවිතාවබෝධය ලබා ගැනීමට බුදුදහමේ ඉගැන්වෙන "භාවනාව" ඉතාමත් සාර්ථක සහ ප්‍රායෝගික ප්‍රවේශයකි. මෙමගින් මදිරාබාධයෙන් මුදවා ගැනීමත්, කුඩාකළ සිටම මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ අවබෝධය තුළින්ම පෙන්වා දීමට සැලැස්වීමක් තුළින් එයින් වළක්වා ගැනීමද සිදුකළ හැකි අතර පුද්ගලයා ලෞකික හා ලෝකෝත්තර සුවපත්භාවයට පත්වීමද එමගින් සිදුවේ.

කෙසේ නමුත් ගැටලුවට පෙරත්, ගැටලුව අවස්ථාවේදීත් ඉන් පසුවත් සතර බ්‍රහ්ම විහරණ පදනම්ව සිදුකෙරෙන අවවාදය, අනුශාසනය සහ අනුග්‍රහය මගින් ශීල, සමාධි, ප්‍රඥා වර්ධනය කරමින් මදිරාබාධයෙන් පුද්ගලයා මුදවා ගැනීම සඳහා වන බෞද්ධ මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ඉතා ප්‍රතිඵලදායී වේ.



බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර
MA in Bud. St (U of Kel), PGD in Bud. St (U of Kel)
PGD in LRHRM ( UOC ) , Ad. Dip in HRM ( NIBM)
Dip in Eng ( U of Raj )






## 144 වන සංවත්සරයට සමගාමීව සංවිධානය කළ

# ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය 2025

ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය 2025 මාර්තු මස 24 දින සිට 28 දින දක්වා පනාගොඩ යුද හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්වූ අතර, තරඟාවලියේ අවසන් දින උත්සවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.





තවද මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර ආඥාපති මේජර් ජෙනරාල් යූ කේ ඩී ඩී පී උඩගම RWP RSP USP ndc psc, සටකාර්ය සම්පාදන අණසක ආඥාපති ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර සහ යුද්ධ හමුදා වොලිබෝල් කමිටු සභාපති මේජර් ජෙනරාල් ටී එම් පී ඒ අඹන්පොල, 14 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ජේ එන් එම් පී කේ නවරත්න RWP RSP ndu යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වූ අතර ශ්‍රී ලංකා වොලිබෝල් විනිසුරු කමිටුවේ ලේකම් විමලරත්න රාජකරුණා මහතා ඇතුළු පිරිසක් විශේෂ ආරාධිතයින් ලෙස සහභාගී වූහ.

මෙවර වොලිබෝල් ශූරතාවලිය සඳහා සුපර් ලීග් කාණ්ඩයේ කණ්ඩායම් 06 ක් ද, A කාණ්ඩයේ



කණ්ඩායම් 14ක්ද වශයෙන් පිරිමි කණ්ඩායම් 20ක් තරඟ වැදුණු අතර, කාන්තා කණ්ඩායම් 04 ක් සහභාගී වූහ. වොලිබෝල් පිරිමි සුපර් ලීග් අවසන් මහ තරඟය සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම සමගින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම සුදුසුකම් ලබා ගත් අතර, ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම මෙවර සමස්ත ශූරතාවය දිනා ගැනීමට සමත්විය.

කාන්තා වොලිබෝල් ශූරතාවලියේ අවසන් තරඟය සඳහා ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බළකා කාන්තා කණ්ඩායම සමගින් 3 වන ස්වේච්ඡා කාන්තා බළකා කණ්ඩායම තරඟ වැදුණු අතර, එහිදී ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බළකා කාන්තා කණ්ඩායම ශූරතාව දිනා ගන්නා ලදී.

**A** කාණ්ඩයේ තරඟාවලියේ අවසන් තරඟය සඳහා ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සහ ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බළකාය තරඟ වැදුණු අතර, එහිදී ඉංජිනේරු සේවා රෙජිමේන්තුව ශූරතාවය දිනා ගන්නා ලදී.

වොලිබෝල් ශූරතාවලියේ සුපර් ලීග් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සෙ/ඩී103105 පාසෙ අබේසිංහ ඩීකේආර්පී විසින් දිනාගත් අතර, කාන්තා වොලිබෝල් ශූරතාවලියේ දක්ෂතම ක්‍රීඩිකාවට හිමි කුසලානය ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බළකායට අයත් සෙ/ඕ103633 ලා/කෝ මධූරිකා ජේපීඒ විසින්ද **A** කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සෙ/එස්108308 ලා/කෝ තරංග එම්ඒඩී විසින්ද දිනා ගන්නා ලදී.

මෙවර ශූරතාවලියේ ශූරයින් වෙත ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ සහ ආරාධිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සුරතින් කුසලාන/පදක්කම් හා සහතිකපත් ප්‍රදානය සිදුවිය. මෙම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර ඇතුළු ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් නිලධාරිණියන් මෙන්ම සෙසු නිල සාමාජිකයන් රැසක් සහභාගී වූහ.









ශූරතාවය
ශ්‍රී ලංකා පාබල හමුදාව



අනු ශූරතාවය
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



කාන්තා ශූරතාවය
ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බළකාය









ජෛව විවිධත්වයෙන් අනූන සීතාවක තෙත් බිම ලෙස ප්‍රචලිත වරක තුනී ලැලි සංස්ථාව පිහිටි භූමිය වූ වත්මන් ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කඳවුර 2016 වර්ෂයේදී අනපේක්ෂිත පිපිරීමකට ගොදුරු වුවද අද වන විට අංගසම්පූර්ණ කඳවුරකි. ප්‍රදේශයට මෙතෙක් අඩුපාඩුවක්ව පැවති, අංගසම්පූර්ණ ක්‍රිකට් ක්‍රීඩාංගනයක අවශ්‍යතාව සපුරාලමින් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් නිර්මාණය වූ මෙම ක්‍රීඩාංගනය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අනුග්‍රහයත් රාගම ක්‍රිකට් සමාජයේ සහයෝගයත් ලැබී ඇත.





වර්තමාන යුද්ධ හමුදාධිපති, 57 වන ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස අප වෙනුවෙන් කළ මඟපෙන්වීම හා අප වෙත ලබා දුන් ආශිර්වාදය ස්වේච්ඡා බළසේනාවෙහි සියලු කටයුතු සඳහා ආලෝකයක් වූ බව මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරමු.





ස්වේච්ඡා බළසේනා මූලස්ථාන "Rendezvous" ක්‍රිකට් ක්‍රීඩාපිටිය වර්ෂ 2025 ක් වූ අප්‍රියෙල් මස 08 වන දිනට යෙදුණු සුබ මුහුර්තයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රුද්‍රිගෝ RSP ctf-ndu psc ගේ සුරතින් විවෘත වීමට නියමිත අතර මෙම ක්‍රීඩාංගනය යුද හමුදාව තුළ ක්‍රිකට් ක්‍රීඩාව නැංවීමට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගත උන්නතිය සඳහා තැබූ යෝධ පියවරකි.



# 144 වන සංවත්සර සැමරුමට සමගාමීව ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කඳවුරට අංගසම්පූර්ණ ක්‍රිකට් ක්‍රීඩාංගනයක් විවෘත වන වගයි ...

දසත පතළ රන් හිරු රැස මෙන් දිලි
ලක් නාමය ලෝ තුඩ තුඩ නැංවී
සෙව් බළ සෙන් කිතුගොස බලගැන්වී
ක්‍රිකට් වසන්තෙට නව මං හෙළිවී